සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 50 S I,II

නම: ........................................ **නාට්‍ය හා රංගකලාව** කාලය පැය දෙකයි.

★ **පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ඒ උනාට මිනිහෝ නිදිමතේ පුළුවන් ද?
රටක් පාලනය කරන්න.

B - පයින් ඇවිදිල්ලා - මහන්සිද මන්දා
ගොඩින් පැනගත්ත - හුඟක් ළඟ හින්ද

C - මහරජ කිමෙක් ද? තෙපි පයින් ම ආයේ ද?
ස්වාමිණි මම පයින් නොආමි - රථයෙන් ම ආමි

D - අතට වළලු ද - පයට ගිගිරි ද
ලා ගනී - කිඳුරගන සොබනා

01) 'A' අක්ෂරයට අයත් ලෝකධර්මී සංවාදය අයත් නාට්‍යය කුමක් ද?,
1. ජනේලය 2. සුහ සහ යස 3. තලමල පිපිලා 4. කැළණි පාලම

02) ඉහත බෞද්ධ පූජා කර්මයකට අයත් සංවාද ඛණ්ඩය ඇතුළත් අක්ෂරය වන්නේ,
1. A 2. B 3. C 4. D

03) 'B' අක්ෂරයට අයත් සංවාදය ඇතුළත් නාට්‍යයේ නිර්මාණකරු කවුද ?,
1. රංජිත් ධර්මකීර්ති 2. එදිරිවීර සරච්චන්ද්‍ර
3. ගුණසේන ගලප්පත්ති 4. දයානන්ද ගුණවර්ධන

04) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් නිෂ්පාදනය කළ නාට්‍යයකට අයත් සංවාදය ඇතුළත් අක්ෂරය වනුයේ,
1. B 2. C 3. D 4. A

05) ජනකතා දෙකක් ඇසුරෙන් නිර්මාණය කළ නාට්‍යයකට අයත් අක්ෂරය වන්නේ,
1. C 2. D 3. A 4. B

★ **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06) ''අංගාර ගඟ ගලා බසී'' සහ ''ආඩිරළේ නාඩගම'' යන සංගීතමය නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරු වන්නේ,
1. රංජිත් ධර්මකීර්තී ය 2. දයානන්ද ගුණවර්ධනයන් ය
3. ගුණසේන ගලප්පත්ති ය 4. හෙන්රි ජයසේනයන් ය

07) විදේශීය නාට්‍යයකින් ලබාගත් තේමාවක් අනුව නිර්මාණය කළ හාස්‍ය රසයෙන් අනූන වූ නාට්‍යයකි.
1. ජීවන වංචාව 2. ගජමන් පුවත 3. බක්මහ අකුණු 4. කාමරේ පොරේ

08) ''ජස ලෙන්චිනා'' නාටකය නිර්මාණය කිරීම සඳහා යොදාගත් ගැමි නාටක සම්ප්‍රදාය කුමක් ද?
1. සොකරි 2. කෝළම් 3. නාඩගම් 4. නූර්ති

09) චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් ඇතිවීම,
1. ගැටුම යි 2. සමාරෝපය යි 3. අනුකරණය යි 4. අභිනය යි

10) චරිතයක අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශ කිරීම.
1. ආංගික අභිනය යි
2. වාචික අභිනය යි
3. ආහාර්ය අභිනය යි
4. සාත්වික අභිනය යි

**★ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පහත දැක්වෙන වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| නාට්‍යකරු | නාට්‍ය | රංගන ශිල්පියා | රඟපෑ චරිතය |
|---|---|---|---|
| එදිරිවීර සරච්චන්ද්‍ර | සිංහබාහු | .....A..... | සිංහයා |
| ගුණසේන ගලප්පත්ති | .....B..... | සිරිල් වික්‍රමගේ | තේගිරිස් |
| .....C..... | මායාදේවි | මාලනී රණසිංහ | දෙනගමහාමිනේ |
| දයානන්ද ගුණවර්ධන | ගජමන්පුවත | නිශ්ශංක දිද්දෙනිය | .....D..... |
| එදිරිවීර සරච්චන්ද්‍ර | රත්තරං | .....E..... | මැහැල්ල |

11) ඉහත වගුවේ 'A' අක්ෂරයට අදාළ විය යුතු රංගන ශිල්පියා වනුයේ,
1. එඩ්මන් විජේසිංහ ය.
2. නිශ්ශංක දිද්දෙනිය ය.
3. මාක් ඇන්ටනී ය.
4. ජයලත් මනෝරත්න ය.

12) ඉහත වගුවේ 'B' අක්ෂරයට අදාළ විය යුතු නාට්‍ය වන්නේ,
1. වලහා ය. 2. මුදු පුත්තු ය. 3. නරිබෑණා ය. 4. මනමේ ය.

13) වගුවේ 'C' අක්ෂරයට අදාළ විය යුතු නාට්‍යකරු වන්නේ,
1. ගුණසේන ගලප්පත්ති ය.
2. රංජිත් ධර්මකීර්ති ය.
3. හෙන්රි ජයසේන ය.
4. කේ.බී. හේරත් ය.

14) 'D' අක්ෂරයට අදාළ චරිතයක් වන්නේ,
1. සක්දෙව් ය. 2. බරණැස් රජු ය. 3. ඇලපාත මුදලි ය. 4. පිංගල ය.

15) වගුවේ 'E' අක්ෂරයට අයත් විය යුතු රංගන ශිල්පිණිය වන්නේ,
1. සෝමලතා සුභසිංහ ය
2. මාලනි රණසිංහ ය
3. ට්‍රිලිෂියා ගුණවර්ධන ය
4. මැණිකේ අත්තනායක ය

**★ ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(ලෝමහංස, මෝදර මෝල, දර්පන, සංවාද, නරියා, මහාසාර, සිංහයා)

16) ................................ නාට්‍ය පෙළක තිබිය යුතු වැදගත්ම අංගයකි.

17) ලෝකධර්මී නාට්‍යයක් ලෙස ................................ නාට්‍යය නම් කළ හැකිය.

18) ................................ නාට්‍යය මහා පදුම ජාතකය ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යයකි.

19) දෑස් අතර සම්බන්ධතාවය ඇති කරලීම සඳහා ................................ අභ්‍යාසය කරනු ලබයි.

20) ................................ දයානන්ද ගුණවර්ධනගේ නාට්‍යයක එන සත්ව චරිතයකි.

## II කොටස

★ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

**01. පහත සඳහන් සංවාද කාණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

''(ඔච්චම් කරන ලීලාවෙන්) එහෙනම් දුන්නම එපා කියලා දාලා ගියෙ.
කවුද එයාට දෙන්න කිව්වේ...? එයාට දෙන්න යුතු නෑ..........''

i. ඉහත සංවාද කාණ්ඩය අයත් නාට්‍යය හා එහි ශෛලිය නම් කරන්න.
ii. එම නාට්‍යයට මූල බීජය සපයාගත් මූලාශ්‍ර ග්‍රන්ථය කුමක් ද?
iii. මෙම නාට්‍යය ප්‍රථම වරට වේදිකාගත වූ ස්ථානය හා වර්ෂය සඳහන් කරන්න.
iv. ඉහත සංවාද කාණ්ඩය ප්‍රකාශ කරනු ලබන්නේ කවුරුන් විසින් ද? කාහට ද?
v. මෙම නාට්‍යයේ එන බෝසත් චරිතයෙන් ප්‍රකට වන යහපත් ගුණාංග 02 ක් ලියා දක්වන්න. (ල.2 x 5 = 10)

02) i. බෞද්ධ පූජාකර්ම 02 ක් නම් කරන්න. (ල.2)
ii. බෞද්ධ පූජාකර්ම වල ඇතුළත් නාට්‍යමය ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ල.3)
iii. එම නාට්‍යමය ලක්ෂණ බෞද්ධ පූජාකර්මයක් ඇසුරෙන් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.5)

03) i. අංග රචනය යනු කුමක් ද? (ල.2)
ii. අංග රචනය සඳහා ගන්නා ද්‍රව්‍ය 03 ක් සඳහන් කරන්න. (ල.3)
iii. නාට්‍යයකට අංගරචනය වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ල.5)

04) i. ප්‍රධාන නාට්‍ය ශෛලීන් 02 නම් කරන්න. (ල.2)
ii. එම ශෛලීන් දෙකෙහි විශේෂ ලක්ෂණ 03 බැගින් සඳහන් කරන්න. (ල.3)
iii. ඉහත නාට්‍යය ශෛලීන් දෙක අතරින් ඔබ නැරඹූ එක් ශෛලියකට අයත් නාට්‍යයක ඉහත ලක්ෂණ භාවිතා කරන ආකාරය විස්තර කරන්න. (ල.5)

05) පහත දැක්වෙන සිද්ධිය ඇසුරු කරගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.
''පාසල නිම වී අමල් යහළුවන් සමඟ පාරේ යමින් සිටින විට, එකවරම 'අමල්' යැයි තම නම කියා උස්හඬින් කතා කරන හඬක් ඇසේ. අමල් හා යහළුවන් එකවරම ආපසු හැරී බලයි.'' එවිට......................

නාට්‍යපෙළ ගොඩනැගීමේ දී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න
i. පසුබිම, කාලය, චරිත, රංගවිධාන සංවාද සහිත පෙළ රචනය (ල.3)
ii. ගැටුම් අවස්ථා පරිකල්පනය පෙළ රචනය (ල.3)
iii. කතා වස්තුව, කාලෝචිත, නිර්මාණශීලි, අපූර්වත්වයෙන් යුතු පෙළ රචනයෙන් යුක්ත වීම. (ල.4)